NATIONAL ESSAY COMPETITION FOR SCHOOL CHILDREN

INSPIRING YOUNG MINDS. SECURING TOMORROW.

PROMOTING FINANCIAL LITERACY THROUGH LIFE INSURANCE

FALIA | IASL

# ලියාපදිංචි වීම සඳහා වන උපදෙස්

ලියාපදිංචි වීම සඳහා වන Google පෝරමය (Google form) සම්පූර්ණ කිරීමට පෙර පහත සඳහන් උපදෙස් හොඳින් කියවන්න.

1. ලියාපදිංචි වීම සඳහා වන Google පෝරමය (Google form) තරඟයට ඉදිරිපත්වන ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ මව, පියා හෝ නීත්‍යානුකූල භාරකරු විසින් සම්පූර්ණ කර යොමු කළ යුතුය.

2. එක් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම් කිරීමක්/ ලියාපදිංචි වීමක් පමණි. එක් ශිෂ්‍යයෙකුගෙන්/ශිෂ්‍යාවකගෙන් අයදුම් කිරීම්/ ලියාපදිංචි වීම් කිහිපයක් ලැබුණහොත් එම සියලුම අයදුම් කිරීම් අවලංගු ලෙස සලකනු ලබන අතර ඒවා පිළිගනු නොලැබේ.

3. තරඟයට සහභාගිවන්නාගේ තොරතුරු නිවැරදිව ලබා ගැනීම සහතික කිරීමට ලියාපදිංචි වීම/ අයදුම් කිරීම සඳහා වන Google පෝරමය (Google form) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය.

4. සපයනු ලබන සියලුම තොරතුරු නිවැරදි සහ සම්පූර්ණ විය යුතුය. වැරදි, අසම්පූර්ණ හෝ නොමග යවන සුළු තොරතුරු ඇතුළත් කිරීම හේතුවෙන් ප්‍රමාද වීම් හෝ තරඟයෙන් ඉවත් කිරීම සිදු වීමට ඉඩ ඇත.

5. වලංගු සහ සක්‍රීය ජංගම දුරකථන අංකයක් සහ විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබා දිය යුතුය. විභාග විස්තර, යාවත්කාලීන කිරීම්, නිවේදන සහ ප්‍රතිඵල ඇතුළුව FALIA ජාතික රචනා තරඟයට අදාළ සියලුම ඉදිරි දැනුම්දීම් සිදු කරනු ලබන්නේ ලියාපදිංචි වීමේදී ඔබ ලබා දෙන මෙම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය හරහාය.

6. කරුණාකර ඔබ ලියාපදිංචි වීමේ Google පෝරමය (Google form) සම්පූර්ණ කිරීමේදී ශිෂ්‍ය තොරතුරු අංශය (Student Information) යටතේ පහත සඳහන් හඳුනා ගැනීමේ අංකවලින් එකක් නිවැරදිව ලබා දෙන බවට සහතික වන්න:

    - ජාතික හැඳුනුම්පත් අංකය (තිබේ නම්) හෝ
    - තැපැල් හැඳුනුම්පත් අංකය හෝ
    - උප්පැන්න සහතිකයේ සඳහන් අංකය

    ඇගයීම් ක්‍රියාවලිය සඳහා මෙම තොරතුරු අවශ්‍ය වේ.

7. ශිෂ්‍යයා විභාගයට පෙනී සිටිය යුතු ස්ථානය තීරණය වන්නේ ඔබ තෝරන ප්‍රදේශය අනුව බැවින් විභාගයට ඉදිරිපත්වන දිස්ත්‍රික්කය නිවැරදිව තෝරා ගැනීමට සැලකිලිමත් වන්න. ජාතික රචනා තරඟ විභාගය 2026 අගෝස්තු මාස 22 වන දින ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි නම් කරන ලද විභාග මධ්‍යස්ථානවල පැවැත්වීමට නියමිතය. අයදුම් කිරීමෙන් පසුව, අයදුම්කරු තෝරාගත් විභාගයට පෙනී සිටීමට කැමැත්ත පල කළ දිස්ත්‍රික්කය වෙනස් කිරීමට කරනු ලබන ඉල්ලීම් ඉටු කිරීමට අවස්ථාව නොලැබේ.

8. ලියාපදිංචි වීම සඳහා වන Google පෝරමය (Google form) යොමු කිරීමට පෙර ශිෂ්‍යයාගේ පෞද්ගලික විස්තර, පාසලේ තොරතුරු සහ විභාගය සම්බන්ධ මනාපයන් නිවැරදිව ඇතුළත් කර ඇති බවට වග බලාගන්න.

9. විභාගය අතරතුරදී ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට කිසියම් විශේෂ සහායක් අවශ්‍ය නම්, එය අදාළ කොටසේ සටහන් කර ඒ පිළිබඳ අවශ්‍ය විස්තර ලබා දෙන්න.

10. ලියාපදිංචි වීම සඳහා වන Google පෝරමය (Google form) යොමු කිරීමට පෙර සියලුම තොරතුරු හොඳින් පරීක්ෂා කර බලන්න. Google පෝරමය (Google form) යොමු කළ පසු, එහි කිසිදු වෙනසක් කිරීමට ඉඩ නොලැබෙනු ඇත.

11. ලියාපදිංචි වීම/ අයදුම් කිරීම සම්බන්ධයෙන් හෝ FALIA ජාතික රචනා තරඟය පිළිබඳව ඕනෑම විමසීමක් හෝ සහයක් සඳහා කරුණාකර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත 011 2396184–9 (දිගු 103, 115 හෝ 134) ඔස්සේ දුරකථනයෙන් හෝ mder@ircsl.gov.lk විද්‍යුත් තැපැල් ලිපිනය මගින් සම්බන්ධ වන්න.